# අනගාරික ධර්මපාලතුමන් දුටු ජාතිකාභිවෘද්ධිය සඳහා භික්‍ෂු කාර්යභාරය පිළිබඳ විමර්ශනයක්.

**සූරියවැව විජයවිමල හිමි[1], බලදොර ඉන්ද්‍රජෝති හිමි[2], පාහියංගල සුමංගල හිමි[3]**

*[1]බෞද්ධ දර්ශනය ශාස්ත්‍රවේදී (විශේෂ), කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[2]සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[3]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[1*]rev.wijayawimala833@gmail.com, [2*]b.indrajothi@gmail.com,*
*[3*]sumangala909@yahoo.com*

''අනගාරික ධර්මපාල'' යන නාමය නිතැතින් ම ජාතික වීරයෙකු සිහියට නන්වයි. සිංහල ජාතිය, ආගම නගාසිටුවීමෙහිලා පුරෝගාමී වූ මෑතකාලීන සුවිශේෂී ජාතික වීරවරයෙකු වශයෙන් අනගාරික ධර්මපාලතුමන්, සමස්ත ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධයාගේ මෙන් ම ලෝකවාසී බෞද්ධයන්ගේ ගෞරවයට පැසසුමට පාත්‍රවේ. බෞද්ධ මූලධර්මයන්ගෙන් සුපෝෂිත ජාතියක් වශයෙන් සිංහලයා මානව දයාවෙන් අගතැන්පත් ජාතියක් බවට පත්වන්නට හැකි වූයේ එනිසාය. පැරණි ලක්දිව රජදරුවන් පවා වරින්වර ලක්දිවට එල්ල වූ ආක්‍රමණයන්ට එදිරිව අසිපත එසවීමට නොපසුබට වූයේ මානව ගුණධර්මයන්ගෙන් ආඪ්‍ය වූ හෙළ සංස්කෘතිය මතුපරපුරු සඳහා දායාද කිරීම තම යුතුකමක් මෙන් ම වගකීමක් කොට සැළකූ නිසා වියයුතුය. ලංදේසී, ඉංග්‍රීසි වැනි යුරෝපීයයන් ලංකාව ආක්‍රමණය කිරීමෙහි අරමුණ සුපුරුදු ආර්ථික ප්‍රතිලාභයන්ට පමණක් සීමා නොවුණු අතර දේව ආගම ප්‍රචාරය කිරීමේ මූලිකාභිලාසය සහ යටත් කොලනියක් කරගැනීමේ උත්සාහය ප්‍රකට විය. මෙහිදී ඉංග්‍රීසීන්ගේ ක්‍රියාකලාපය ඉතාම දරුණු මර්දනකාරී ක්‍රමවේදයක් වූ අතර ජාතිය, ආගම වෙන් කොට නව යුරෝපීය සංස්කෘතිකාංග මෙහි ප්‍රතිනිර්මාණය කිරීමට උත්සුක වූ බව පැහැදිලිය. එයට එරෙහිව ජාතිමාමකයෝ ජාතික ව්‍යාපාර අරඹන ලදහ. හෙළ සංස්කෘතියේ ආධ්‍යාත්මික නායකයන් වූ භික්‍ෂුව තම ශාසන වත්පිළිවෙත් පසෙකින් තබා ජාතික ව්‍යාපාරයට පණ පොවමින් සිටි අවධියකි. 1864 සැප්තැම්බර් 17 වන දින මෙලොව එළිය දුටු ඩේවිඩ් හේවාවිතාරණ පසුකාලීනව අනගාරික ධර්මපාල යනුවෙන් ප්‍රසිද්ධියට පත්ව ජාතිය නගාසිටුවීමේ දුවැන්ත කාර්යභාරය සඳහා තම ජීවිතයම අනගාරිකව කැප කළ සැටි විශ්මය ජනකය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ ගොනුවන්නේ අනගාරික ධර්මපාල තුමන් විසින් රචිත ලිපි ලේඛනයන් ඇසුරින් ජාතිකාභිවෘද්ධිය සඳහා භික්‍ෂු කාර්යභාරය පිළිබඳ දුලභ වශයෙන් සඳහන් වී ඇති අදහස් පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමයි.

මුඛ්‍ය පද ඃ මූලධර්ම, විදේශාක්‍රමණ, වත්පිළිවෙත්, ජාතිකාභිවෘද්ධිය, කාර්යභාරය